අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"இசுருபாய", பத்தரமுல்ல, இலங்கை.
"Isurupaya", Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ අංකය / எனது இல. / My Ref. } ED/04/59/08/01/01

ඔබේ අංකය / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2025.08. 21

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

සියලුම කලාප අධ්‍යක්ෂවරුන්,

සියලුම පීඨාධිපතිවරුන්,

සියලුම ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්,

සියලුම ගුරු මධ්‍යස්ථාන කළමනාකරුවන්,

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධ අභියාචනා - 2025</u>**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්ගේ 2025 වර්ෂය සඳහා සිදු කරන ලද වාර්ෂික ස්ථාන මාරුවීම් හා බැඳේ.

02. එම ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයේ තීරණ මේ සමඟ ඉදිරිපත් කරමි.

03. ඒ අනුව, අභියාචනා මණ්ඩලයේ තීරණය පරිදි අදාළ ස්ථාන මාරුවීම් 2025.09.01 දින සිට ක්‍රියාත්මක වේ. එබැවින්, ස්ථාන මාරුවීම් ලැබූ සියලුම නිලධාරීන් අදාළ දිනයේ නව සේවා ස්ථානවල රාජකාරි භාර ගැනීමට හැකි වන සේ වර්තමා සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් මත නියමිත පරිදි ස්ථාන මාරු නියෝග ලබා ඇති නිලධරයකු නව සේවා ස්ථානය වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින අවස්ථාවකදී, එම නිලධාරියා වෙත ස්ථාන මාරුව ලබා ඇති ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 257V වගන්තිය අනුව සේවය හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට කටයුතු කළ යුතුය.

එස්.ඩබ්. චිත්‍රා රෝහිණී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ගුරු අධ්‍යාපනඥ)

අත්. කළේ - නාලක කලුවැව
ලේකම්

**සටහන - වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම් දින 14ක් ඇතුළත මේ සමඟ දක්වා ඇති ආකෘති අංක 03 සම්පූර්ණ කර යොමු කළ යුතුය.**